මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| ඉතිහාසය | 11 ශ්‍රේණිය | කාලය : පැය 01යි |
|---|---|---|

## I පත්‍රය

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

01 මහා වංශයෙහි අර්ථ විවරණය කිරීමට රචනා කර ඇති ග්‍රන්ථය කුමක්ද ?
1 වංසත්ථප්පකාසිනිය 2 සමන්තපාසාදිකාව 3 බෝධිවංශය 4 රසවාහිනිය

02 ගල් යුගයේ ප්‍රජාව පිළිබඳ තොරතුරු ලබාගත හැකි අත්තනගොඩ අළුලෙන පිහිටා ඇති පරිසර කලාපය කුමක්ද ? ,
1 පහතරට තෙත් කලාපය 2 අර්ධ ශුෂ්ක කලාපය
3 පහතරට අතරමැදි වියළි කලාපය 4 පහත රට වියළි කලාපය

03 ලංකාවට පැමින තොරතුරු වාර්තා කළ අරාබි ජාතික ලේඛකයකු වන්නේ,
1 ප්ලිනි 2 මෙගස්තිනිස් ය 3 ඉබන් බතූතා ය 4 පාහියන් හිමි ය

04 ශ්‍රී ලංකාවේ දේශපාලන බලය මධ්‍යගත වීමෙන් පසු රාජ්‍ය පරිපාලන සැකැස්මට අයත් නිලධාරීන් අ තීරුවේද එම නිලධාරීන් අතීතයේ හැදින්වූ නම් ආ තීරුවේද දැක්වේ. පහත **අ** සහ **ආ** තීරය නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1 භෝජනාගාර අධිකාරි | A අමෙත |
| 2 නගර පරිපාලක | B ශෙනපති |
| 3 ඇමතිවරු | C මහමත |
| 4 සේනාපති | Dනගරගුතික |
| | E බතගු |

1CBDA 2 EDAB 3 EABD 4 DABC

05 පොළොන්නරු යුගයට අයත් ගල්පොත ශිලා ලිපිය කරවූ රජතුමා වන්නේ
1 පළමුවන විජයබාහු 2 පළමුවන පරාක්‍රමබාහු 3 කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල 4 දෙවන විජයබාහු

06 පහතරට තෙත් කලාපීය ලෙන් සඳහා දැක්විය හැකි උදාහරණ

1 මිනිහාගල්කන්ද,බුන්දල 2 පාහියන්ගල , බටදොඹලෙන

3 අලිගල හා පොතාන 4 බෙල්ලන්බැඳිලැස්ස,පොතාන

07 මෙයට වසර 12500කට පෙර මෙරට මානවයින් ඇට වර්ග පුළුස්සා ආහාරයට ගත් බවට සාක්ෂි හමුවන ස්ථානයක්

වන්නේ,

1 කිතුල්ගල බෙලිලෙන 2 බටදොඹලෙන 3 රාවනා ඇල්ල ලෙන 4 බෙල්ලන්බැඳිලැස්ස

08 පැරණි වාස්තු විද්‍යාඥයින් මහල් ගොඩනැගිලි නිර්මාණය කිරීමට නිපුනතාවයක් දැක්වූ බවට උදාහරණයක් වන්නේ,

1 ඉසුරුමුණි විහාරය 2 ලෝවාමහාපාය 3 ජේතවනාරාමය 4 අභයගිරි විහාරය

09 අතීතයේදී වරාය ආශ්‍රිතව තිබූ ගම් හඳුන්වා ඇත්තේ,

1 පට්ඨාන ගාම 2 කේවට්ථි ගාම 3 කසීකාර ගාම 4 වඩ්ඪකීගාම

10 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ඉපැරණිම තොරතුරු ලැබුනු ගල් ගුහාව වන්නේ,

1 පාහියන්ගල 2 පතිරාජවෙල 3 පොතාන 4 බටදොඹලෙන

11 දන්ත ධාතූන් වහන්සේ මෙරටට වැඩම කරන ලද්දේ කුමන වරායෙන්ද ,

1 පල්ලවංක 2 දඹකොලපටුන 3 ගෝකන්නතිත්ථ 4 ලංකාපටුන

12 මුල් ඓතිහාසික යුගය ලෙසින් සැලකෙනුයේ,

1 ක්‍රි.පූ. 300 - ක්‍රි.ව. 300 අතර කාලයයි. 2 ක්‍රි.පූ. 400 - ක්‍රි.ව. 600 අතර කාලයයි.

3 ක්‍රි.පූ. 450 - ක්‍රි.පූ. 350 අතර කාලයයි. 4 ක්‍රි.පූ. 450 - ක්‍රි.ව. 300 අතර කාලයයි.

13 විවිධ දේ මැනිමට විධිමත් මිනුම් ක්‍රම අතීතයේ භාවිත විය. ගුන්ජා, ධරණ, ස්වර්ණ යන නම්වලින් හදුන්වා ඇත්තේ කුමක් මැනීම සඳහා භාවිත කළ මිනුම්ද ?

1 දිග 2 බර 3 දුර 4 කාලය

14 පූර්ව ඓතිහාසික යුගයට අදාලව ඇස් අඳුන් තැබීමට ලෝහ කූරක් භාවිත කළ බවට තොරතුරු ලැබුණු ස්ථානයක් වන්නේ ,

1 ඉබ්බන්කටුව 2 යටිගල්පොත්ත 3 යාපහුව ගල් සොහොන් කනත්ත 4 උඩරංචාමඩම

15 අනුරාධපුර රාජධානියේ අවසාන රජු වන්නේ

1 1 වන කාශ්‍යප රජතුමා 2 පස්වන මිහිඳු රජු 3 හතරවන මිහිඳු රජු 4 කූටකන්ණ අභය රජු

16 ක්‍රිːවː 33-43 කාලයේදී තිස්සමහාරාම වැව ඉදිකරන ලද්දේ කවර රජෙකු විසින්ද?

1 වසභ රජු 2 මහසෙන් රජු 3 ඉලනාග රජු 4 අභයනාග රජු

17 පැරණි ගමක ජිවත් වූ වැසියෙකු ඊළඟ කන්නයේදී ලබාදෙන බවට පොරොන්දුව මත ගමිකගෙන් වී මල්ලක් ලබාගත් බව සඳහන් සාහිත්‍ය මූලාශ්‍රය කුමක්ද?

1 සද්ධර්මාලංකාරය 2 රාජාවලිය 3 ජාතකට්ඨ කතාව 4 සද්ධර්මරත්නාවලිය

18 පහත A තිරුවෙහි දක්වා ඇති කර්මාන්ත සහ B තීරුවෙහි එම කර්මාන්ත අතීතයේ හැදින්වූ නම් සඳහන්වන අතර එය නිවැරිදිව ගලපා පිළිතුර තෝරන්න

| A | B |
|---|---|
| කම්මල් කර්මාන්තය | P තුලාධර |
| රන් කර්මාන්තය | Q දටික |
| ඇත්දත් කර්මාන්තය | R තතවය |
| රෙදි විවීම | S කබර |

1 SPQR 2 SPRQ 3 SRPQ 4 PQSR

19 කෝට්ටේ රාජ්‍යයේ අටවන වීර පරාක්‍රමබාහු නමින් රජකමට පත්වූයේ

1 සපුමල් කුමරු 2 ටිකිරි කුමරු 3 අම්බුළුගල කුමරු 4 ධර්මපාල කුමරු

20 පැරණි සෙල්ලිපි වල වෙළඳ සමූහයක් හැදින්වීමට භාවිත කරන ලද්දේ,

1 පදි නමිනි 2 වාපර 3 පූගය 4 පදිලද්දන්

21 සුළඟ නිසා ඇතිවන ජල තැංග මගින් වැව් බැම්ම බාදනයවීම වැළැක්වීමට ඉදිකර ඇති අංගය කුමක්ද?

1 සොරොව්ව 2 වැව් බැම්ම 3 රළපනාව 4 බිසෝකොටුව

22 මැටි තට්ටුවක් , පස් තට්ටුවක් , බොරළු තට්ටුවක්, කිරිමැටි තට්ටුවක් ලෙස පස් තට්ටු කිහිපයක් එකිනෙක මත අතුරා ශක්තිමත් වැව් බැම්මක් නිර්මානය කර ඇති වැවකි,

1 පරාක්‍රම සමුද්‍රය 2 මින්නේරිය වැව 3 සීගිරිය මහ වැව 4 යෝධ වැව

23 භාතිකාභය රජතුමා මෙරටට රෝමයෙන් රතු පබළු ගෙන්වාගත් බව මූලාශ්‍ර වලින් තහවුරු වේ. ඉන් පැහැදිළි වන්නේ

1 ආනයනය කළ භාණ්ඩ අතර පබළු ප්‍රධාන භාණ්ඩයක් වූ බවයි

2 අතීතයේදී පෙර අපර දෙදිග රටවල් සමඟ වෙළදාම් කළ බවයි

3 සියළුම අත්‍යවශ්‍ය දේවල් ආනයනය කළ බවයි

4 අපරදිග රටවල් සමඟ පමණක් වෙළදාම් කළ බවයි

24 පැරණි මූලාශ්‍රවල අඩික යනු

1 වැව් වලින් බදු එකතු කළ අය 2 වැව් තැනවූ අය
3 ඇළ මාර්ග තැනීම හා සම්බන්ද අය 4 ඇළ මාර්ග වලින් බදු එකතු කළ අය

25 අතීතයේ ස්වභාවික සුළං බලයෙන් යකඩ නිස්සාරණය කළ ස්ථානයක් වන්නේ,

1 දෙහිගහ ඇළකන්ද ප්‍රදේශය 2 බලංගොඩ සමනළ වැව ප්‍රදේශයි

3 බෙරගල ප්‍රදේශය 4 සීගිරිය පොතාන ප්‍රදේශය

26 මංගර නැමති ස්වදේශික දෙවියෙකු උදෙසා කිරිමඩු යාගය පැවැත්වූ බවට තොරතුරු ලැබෙන ස්ථානයකි

1 පල්ලේබැද්ද ගල්පාය ප්‍රදේශයි 2 සීගිරිය අලකොළ වැව 3 හල්දුම්මුල්ල බෙරගල 4 ඉබ්බන්කටුව

27 දිග මැනීම සඳහා භාවිත කළ කුඩාම ඒකකය වුයේ,

1 වීහ 2 ගුන්ජා 3 වියත 4 පරමානුව

28 රජුට අයත් ඉඩම් වගාකිරීම වෙනුවෙන් අයකළ බදු වර්ගයක් වන්නේ

1 දකපති 2 බෙජකපති 3 මතර මපිබක 4 කැති අඩ

29 කිසිදු සතෙකු නොමැරිය යුතු බව සඳහන් කරමින් "මාඝාත නීතිය" නමින් නීතියක් පනවන ලද්දේ,

1 නිශ්ශංකමල්ල රජුය 2 iv වන මහින්ද රජුය 3 අමණ්ඩ ගාමිණී රජුය 4 කුටකණ්ණතිස්ස රජුය

30 ක්‍රි:පූ: 750 - 450 කාලයට අදාළව ඉන්දියාවෙන් ආනයනය කල පබළු භාවිත කර සෑදූ පබළු මාලයක් හමුවූ ස්ථානයක් වන්නේ

1 ඉබ්බන්කටුව 2 යටිගල්පොත්ත 3 යාපහුව ගල් සොහොන් කනත්ත 4 උඩරංචාමඩම

31 ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් පරිදි සාලි, වීහි, කැදෑස යන නම්වලින් හදුන්වා ඇත්තේ

1 ධාන්‍ය වර්ග 2 රසකැවිලි 3 ඖෂධ වර්ග 4 පාන වර්ග

32 ඉංග්‍රිසීන් මෙරටට පැමිනෙනවිට මෙරට සිටි ලන්දේසි ආණ්ඩුකාරයා වූයේ

1 ෆන් එංගල් බෙක් 2 වෙස්ටර් වෝල්ඩ් 3 ස්පිල්බර්ජන් 4විලියම් ෆල්ක්

33 මින්නේරිය, ගිරිතලේ, කවුඩුල්ල, යන වැව් සඳහා ජලය ලබා ගැනීමට අඹන් ගඟ හරස්කර ඉදිකළ ඇළ මාර්ගය වන්නේ.

1 යෝධ ඇළ 2 පබ්බතන්න ඇළ 3 රිදීබැදි ඇළ 4 ඇළහැර ඇළ

34 පුනරුද සමයේ සිදුවූ වැදගත්ම දේශපාලන වෙනස්වීම වූයේ

1 ප්‍රාදේශිය රාජ්‍යවලට බලය බෙදීයාම 2 ජාතික රාජ්‍ය බිහිවීම

3 රාජාණ්ඩු බිඳවැටීම 4 දේශගවේශන ව්‍යාපාර බිහිවීම

35 අප රටේ ප්‍රථම වැඩවර්ජන ව්‍යාපාරය වූයේ

1 වැල්ලවත්ත රෙදි මෝලේ වර්ජනය 2 රෙදි සෝදන්නන්ගේ වර්ජනය

3 කොළඹ මුද්‍රණකරුවන්ගේ වර්ජනය 4 කරත්තකරුවන්ගේ වර්ජනය

36 A හා B ගළපා නිවැරදි පිළිතුර තෝරන්න

| A | B |
|---|---|
| i වානේ නිපදවීමේ නව ක්‍රමය | P හම්ප්‍රි ඩේවි |
| ii රෝලර් යන්ත්‍රය | Q හෙන්රි බෙසර්මර් |
| iii ආරක්ෂක ලාම්පුව | R ජේම්ස් වොට් |
| iv වාෂ්ප එන්ජිම | S හෙන්රි කෝට් |

Ⅰ PQRS Ⅱ QSRP Ⅲ SQPR Ⅳ QSPR

37 බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට ක්‍රියාත්මක කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කිහිපයක් අ තීරුවේ දැක්වෙන අතර ඊට අදාළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කිහිපයක් ආ තීරුවෙහිද දැක්වේ. අ සහ ආ තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

| අ | ආ |
|---|---|
| 1 ක්‍රි:ව: 1833 | A සීමිත ජන්දයෙන් නියෝජිතයන් පත් කිරීම |
| 2 ක්‍රි:ව: 1910 | B සර්වජන ජන්ද බලය |
| 3 ක්‍රි:ව: 1920 | C ව්‍යවස්ථාදායක සභාව පිහිටුවීම |
| 4 ක්‍රි:ව: 1931 | D පළාත්බඳ ජන්ද කොට්ඨාස ක්‍රමය හඳුන්වාදීම |

(1) ABCD (2) BADC (3) CABD (4) CADB

38 දේශ ගවේෂණයට අවධානය යොමු කළ ප්‍රථම යුරෝපා රට වූයේ?

1 ඕලන්දය 2 පෘතුගාලය 3 බ්‍රිතාන්‍යය 4 ස්පාඤ්ඤය

39 බ්‍රිතාන්‍යයන් උතුරු ඇමරිකාවේ පිහිටුවාගත් ප්‍රථම ජනපදය වූයේ

1 වර්ජිනියා 2 මේරිලන්ඩ් 3 පිව්යෝර්ක් 4 පෙන්සිල්වේනියා

40 ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා මහත් කැපකිරීමක් කළ දේශීය නායකයා වන්නේ?

(1) ඩී. බී. ජයතිලක මහතා (2) එෆ්. ආර්. සේනානායක මහතා

(3) ජෝන් කොතලාවල මහතා (4) ඩී. එස්. සේනානායක මහතා

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| ඉතිහාසය | 11 ශ්‍රේණිය | කාලය : පැය 03යි |
|---|---|---|

## II පත්‍රය

**පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න**

- **I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ**
- **II කොටසින් ප්‍රශ්න 04 කටද III කොටසින් එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි**

### I කොටස

01 (අ) පහත (I)යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමෙහි ද (II) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කොට නම් කරන්න.

(I) කලා වැව, මාතොට,මිනිහාගල්කන්ද, සෙංකඩගල, ගෝන නදී, පාහියංගල, ගෝකන්න තිත්ථ, අනුරාධපුරය, ඉබ්බන්කටුව, ජම්බුකොළපට්ටන, කොළඹ ,රංචාමඩම,

(ලකුණු 12)

(II) බ්‍රිතාන්‍යය, ඉතාලිය, කොන්ස්තන්තිනෝපලය,මධ්‍යධරණී මුහුද, පෘතුගාලය, , තුර්කිය

(ලකුණු 06)

(ආ) (I)පහත A,B,C,D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින්, ස්ථාන හා ඓතිහාසික මූලාශ්‍ර අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A- ලංකාවේ සිටි අවසාන ලන්දේසි ආණ්ඩුකාරයා

B- ක්‍රි:ව: 90 -168 කාලය තුළ ලංකා සිතියමක් නිර්මාණය කළ භූගෝල ශාස්ත්‍රඥයා

C- ගම්පොළ රජධානි සමයේ මෙරටට ආක්‍රමණයක් එල්ල කළ චීන සෙන්පතියා

D- මෙරට මුහුදුබඩ ප්‍රදේශවල ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරයා

(ලකුණු 04)

- යාබද A සහ B යටතේ දක්වා ඇති කලා නිර්මාණ හොඳින් අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න



**A**

1 මෙම නිර්මාණය කුමක් ද?

2 මෙය හමුවූ ස්ථානයේ ඇති චෛත්‍ය කුමක් සිහිවීමට ඉදිකරන ලද්දක්ද ?

3 මෙය තුළින් කුමන විද්‍යාත්මක මූලධර්මයක් නිරූපනය නන්නේ ද?

4 මෙය සොයා ගන්නා ලද්දේ කුමන ස්ථානයකින්ද?

(ලකුණු 04)



B

1 මෙම පින්තූරයෙන් දැක්වෙන නිර්මානය කුමක්ද?

2 මෙය කාගේ නිර්මානයක් ද?

3 මෙය කුමන කර්මාන්තයකට අයත් ද?

4 මෙය කුමන සියවසක නිර්මානය කරන ලද්දක් ද ?

(ලකුණු 04)

## II කොටස

02 i ප්‍රාග් ඓතිහාසික මානවයන් ජීවත් වූ බවට සාක්ෂි හමු වූ පහතරට තෙත් කලාපීය ලෙන් තුනක් නම් කරන්න

ii ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයන් ආහාරයට ගත් ශාකමය ආහාර වර්ග හතරක් නම්කරන්න

iii පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ ජිවන රටාව හා ආහාර රටාව උදාහරණ සහිතව පැහැදිලි කරන්න

iv මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල ව්‍යුහය හා ස්වරූපය පැහැදිලි කරන්න

03 i මෙරට අතීතයේ පැවති රජ්‍යත්ව සංකල්ප 03 ක් දක්වන්න

ii ගමික විසින් ඉටුකළ කාර්යයන් හතරක් දක්වන්න

iii මෙරට පැරණි සමාජයේ ගෙවිතැනෙහි ස්වභවය කරුණු 02ක් ඇසුරින් පැහැදිලි කරන්න

iv පැරණි ලංකාවේ වෙළදාම සිදුවූ ආකාරය සාධක 02 ක් ඇසුරින් පහදන්න

04 i අපේ මුතුන් මිත්තෝ හේන් වල වගා කළ ධාන්‍ය වර්ග දෙකක් ලියා දක්වන්න

ii ශ්‍රී ලංකාවෙන් සොයාගෙන ඇති දෙමළ සෙල්ලිපිවලට අනුව මෙරට ක්‍රියාත්මක වූ දකුණු ඉන්දීය වෙළඳ සම්භවයක් ඇති වෙළඳ සංවිධාන දෙකක් ලියා දක්වන්න?

iii මෙරට විසූ පැරැන්නන් ජල කලමණාකරණ කටයුතුවලදී ඒ සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික දැනුම භාවිත කර ඇති ආකාරය උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න

iv "පැරැන්නන්ට ලෙඩ රෝගවලින් ආරක්ෂාවීමට බොහෝවිට හැකි වූයේ ඔවුන්ගේ ආහාර රටාවයි" උදාහරණ සපයමින් පැහැදිලි කරන්න

05 i අපේ මුතුන් මිත්තෝ පහත සඳහන් විද්‍යාත්මක සාධක දැන සිටි බවට තොරතුරු ලැබුනු ස්ථාන එක බැගින් නම් කරන්න

A – දහනය සඳහා ඔක්සිජන් අවශ්‍ය බව    B – ශල්‍යකර්ම සඳහා ලෝහමය කතුරු භාවිත කිරීම

C – කානු පද්ධතියක් ඔස්සේ ගලා යන ජලය මත ලීඩනයක් එල්ල කර ජලමල් තැනීම

ii පහත A,B,C,D යටතේ දක්වා ඇති කරුණට අදාළ සෙල්ලිපි වරහන තුළින් තෝරා ලියන්න

( සිතුල්පව්ව, තෝනිගල, වෙස්සගිරිය, ගොඩවාය, කොන්ඩවට්ටවාන් )

A – පුරාන යුගයේ දඩුවම් ක්‍රම    B – වෙළඳ නීති රීති

C – රේගු බදු අය කිරීම    D – නිසි කළට සීසෑම නොකරන අයට දඩයක් නියම කරන බව

iii රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමට බලපෑ හේතුන් දෙකක් උදාහරණ දෙකක් ඇසුරින් පහදන්න

iv පළමුවන විජයබාහු රජුගෙන් සිදුවූ සේවය කරුණු 02ක් ඇසුරින් පැහැදිලි කරන්න

06 i පහත සඳහන් අය බෞතීස්ම ලැබීමෙන් පසු හැඳින්වූ නම් මොනවාද?

A – කුසුමාමන දේවිය    B - යමසිංහ බණ්ඩාර    C – කොනප්පු බංඩාර

ii බුදු දහම නගා සිටුවීමට කීර්ති ශ්‍රී රාජසිංහ රජු ගත් ක්‍රියාමාර්ග 02 ක් දක්වන්න

iii "දෙවන පරාක්‍රමබාහු රජු දඹදෙනි යුගයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයාය" සාධක 02 ක් ඇසුරින් පහදන්න

iv පළමුවන විමලධර්මසූරිය රජු උඩරට රාජයේ සිටි වැදගත් පාලකයෙකු වන්නේ කුමක් නිසාදැයි කරුණු දෙකක් ඇසුරින් පහදන්න

07 i උඩරට රාජ්‍යයට පැමිණි ඉංග්‍රීසි දූතයන් දෙදෙනෙකු නම් කරන්න

ii බ්‍රිතාන්‍යයන්ගේ අවධානය ලංකාව කෙරෙහි යොමුවීමට බලපෑ හේතූන් දෙකක් දක්වන්න

iii 1818 නිදහස් සටනට අසාර්ථක වීමට බලපෑ හේතූන් දෙකක් පැහැදිලි කරන්න

iv 1848 නිදහස් සටනට පසුබිම් වූ හේතු දෙකක් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න

08 i මෙරට කිතු දහම ව්‍යාප්ත කළ මිෂනාරි සමාගම් තුනක් දක්වන්න

ii හින්දු පුනර්ජීවනයක් ඇති කිරීමට ආරුමුග නාවලර්තුමා ගත් ක්‍රියාමාර්ග 02ක් දක්වන්න ?

iii බෞද්ධාගමික පුනර්ජීවනයක් ඇති කිරීමට බෞද්ධ නායකයින් ගත් ක්‍රියාමාර්ග දෙකක් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න ?

iv ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ කැපීපෙනෙන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න

## III කොටස

09 i පුනරුදය යනු කුමක්ද ?

ii දේශ ගවේශණය සඳහා අනුග්‍රහය දැක්වූවන් දෙදෙනෙකු දක්වන්න ?

iii පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් පහදන්න

iv පුනරුදය නිසා ශ්‍රී ලංකාවේ ඇතිවූ දේශපාලන,ආර්ථික හා සමාජ සංස්කෘතික වෙනස්කම් එක බැගින් පැහැදිලි කරන්න

10 i කාර්මික විප්ලවය වූ ප්‍රධාන ක්ෂේත්‍ර 03 කුමක්ද?

ii කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට බලපෑ හේතූන් 04 ක් දක්වන්න

iii කාර්මික විප්ලවය නිසා ලංකාවේ ඇති වූ වැදගත් වෙනස්කම් කෙටියෙන් දක්වන්න

iv කාර්මික විප්ලවයේ යහපත් ප්‍රතිඵල සහ අයහපත් ප්‍රතිඵල කෙටියෙන් දක්වන්න